WWW.OLEVELAPI.COM

OL/2015/14/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

14 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

කතෝලික ධර්මය I, II
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

## කතෝලික ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ස්වාභාවික ශරීරය සහ ආධ්‍යාත්මික ශරීරය පිළිබඳ ව ශුද්ධ වූ පාවුලුතුමා දැනුවත් කළේ,
   (1) තෙසලෝනිවරුනට ලියන ලද දෙවන ලිපියෙනි. (2) කොරින්තිවරුනට ලියන ලද පළමුවන ලිපියෙනි.
   (3) තිමෝතිවරුනට ලියන ලද පළමුවන ලිපියෙනි. (4) එපීසිවරුනට ලියන ලද ලිපියෙනි.

2. තම බිරිය තම සහෝදරිය බව ප්‍රකාශ කරමින් පිලිස්තිවරුන්ගෙන් තම ජීවිතය ආරක්ෂා කර ගනු ලැබුවේ,
   (1) ආබ්‍රහම්තුමා ය. (2) ඊසාක්තුමා ය. (3) ජාකොබ්තුමා ය. (4) දාවිත් රජතුමා ය.

3. "මම මාගේ අණපනත් ඔවුන් තුළ පිහිටුවා එය ඔවුන්ගේ සිත් තුළ ලියන්නෙමි." මෙම දිවැසි වැකිය පැවසුයේ,
   (1) ජෙරමියා දිවැසිවරයා ය. (2) එසකියෙල් දිවැසිවරයා ය.
   (3) මීකා දිවැසිවරයා ය. (4) නාතාන් දිවැසිවරයා ය.

4. "දිළිඳුනට සුබාරංචිය දේශනා කරනු වස් උන් වහන්සේ මා ආලේප කළ සේක." මෙහි දැක්වෙන ආලේප කරන ලද තැනැත්තා වූයේ කවුරුන් ද?
   (1) ස්නාවක ජුවාම්තුමා (2) යෙසායා දිවැසිවරයා
   (3) ජේසුස් වහන්සේ (4) දාවිත් රජතුමා

5. රූප වන්දනාව පාපයක් වන්නේ දස පනතේ කීවැනි පනතට අනුව ද?
   (1) පළමුවැනි (2) දෙවැනි (3) තුන්වැනි (4) නවවැනි

6. "……… ශුද්ධාත්මයාණන්ගේ මුද්‍රාව ලබා ගන්න." මෙම වචන පවසන්නේ කුමන ප්‍රසාද නිධානය දානය කරන අවස්ථාවේ ද?
   (1) පූජාත්වරය (2) ප්‍රසාද ස්නාපනය (3) දිව්‍ය සත්ප්‍රසාදය (4) අභිවෘද්ධි ආලේපය

7. ජර්මනිය දෙකඩ කළ බර්ලින් තාප්පය බිඳ දමා එරට එක්සත් කිරීමට මුල් වූයේ,
   (1) II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය. (2) ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා ය.
   (3) XXIII වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය. (4) VI වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.

8. අවුරුදු දහයේ දී දේව මෑණියන් ළඟ, ඔටුනු දෙකක් තිබුණු බවට දර්ශනයක් දුටුවේ,
   (1) භාග්‍යවත් තෙරේසා මව්තුමිය ය. (2) ශුද්ධ වූ ඇග්නස්තුමිය ය.
   (3) ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා ය. (4) ශුද්ධ වූ සිල්වෙස්ත්‍රෝ මුනිතුමා ය.

9. දෙවියන් වහන්සේ හා ශුද්ධ වූ සභාව සමඟ බිඳ වැටුණු සබඳතාව නැවත ගොඩනැගෙන ප්‍රසාද නිධානය වන්නේ,
   (1) දිව්‍ය සත්ප්‍රසාදයයි. (2) අභිවෘද්ධි ආලේපයයි.
   (3) ආශිර්වාදකාර බන්ධනයයි. (4) සමගි සන්ධානයයි.

10. ප්‍රසාද ස්නාපනයේ අත්‍යවශ්‍ය පිළිවෙත් වන්නේ,
   (1) සුදු වස්ත්‍රය ඇන්දවීම හා ඉටි පහන් දැල්වීම ය.
   (2) ඉටි පහන් දැල්වීම හා යක්ෂයා ප්‍රතික්ෂේප කිරීම ය.
   (3) ජලය වත් කිරීම හා ශුද්ධ වූ ත්‍රිත්වය නමින් ස්නාපනය කිරීම ය.
   (4) ශුද්ධ වූ ක්‍රිෂ්මා තෛලයෙන් ආලේප කිරීම හා සුදු වස්ත්‍ර ළය මත තැබීම ය.

[දෙවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

11. "ඔබ සැම මෙයින් ගෙන අනුභව කරන්න. සැබවින් ම මෙය ඔබ උදෙසා පවරා දෙනු ලබන මාගේ ශරීරයයි." මෙම වදන් පූජා ප්‍රසාදීතුමා විසින් පවසනු ලබන්නේ කුමන යැදුමෙහි දී ද?
(1) ආරම්භක යැදුමෙහි දී (2) පඬුරු පිදීමේ යැදුමෙහි දී
(3) අනුභවයේ යැදුමෙහි දී (4) ස්තෝත්‍ර යාගික යැදුමෙහි දී

12. පූජකවරයේ කාර්යභාරය දක්වා ඇති රාජගුරු ප්‍රසාදීන් පිළිබඳ විශ්ව ප්‍රකාශනය නිකුත් කළේ,
(1) ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව ය. (2) දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ය.
(3) ජෙරුසලම් මන්ත්‍රණ සභාව ය. (4) පළමුවන වතිකාන මන්ත්‍රණ සභාව ය.

13. පොළොව පුරා පැතිර එය යටත් කර ගෙන බලය පැවැත්වීමට මිනිසාට පැවරූ නමුත් එය ක්‍රියාවට යෙදවිය යුත්තේ,
(1) මිනිස්කමට ගරු කරමින් ය. (2) නීතියට අවනත වෙමින් ය.
(3) සංස්කෘතියට අනුකූලව ය. (4) රාජ්‍ය පාලකයන් සිතන ආකාරයට ය.

14. අපගේ ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගැනීමට උපකාර වන්නේ,
(1) ශුද්ධාත්ම දීමනා ය. (2) ශාරීරික පුණ්‍ය ක්‍රියා ය.
(3) ආත්මික පුණ්‍ය ක්‍රියා ය. (4) භාවනාවේ පියවර හතර ය.

15. අපෝස්තලික යුගයේ රෝගීන්ගේ ආලේපනය ප්‍රචලිත ව තිබූ බව සඳහන් වන්නේ,
(1) 2 කොරෙන්ති ලිපියෙහි ය. (2) ජොහන් සුවිශේෂයේ ය.
(3) ජාකොබ්තුමාගේ ලිපියෙහි ය. (4) ගලාති ලිපියෙහි ය.

16. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව යාච්ඤාව යනු,
(1) දෙවිඳුන්ගෙන් අවශ්‍ය දේ පමණක් ඉල්ලීම ය. (2) සිත් හා හදවත් දෙවියන් වහන්සේ වෙත එසවීම ය.
(3) දෙවිඳුනට තුති පිදීමකි. (4) දෙවියන් වහන්සේගේ හඬට සවන් දීමකි.

17. ශෝකය වටලා ගත් තැනට ප්‍රීතිය ද, අඳුරින් වැසී ගිය තැනට ආලෝකය ද, ගෙන යාම සඳහා වරම් ඉල්ලා සිටියේ,
(1) අසීසියේ ක්ලේරා මුනිශ්වරිය ය. (2) ශුද්ධ වූ අගෝස්තීනු මුනිතුමා ය.
(3) වනගත ශුද්ධ වූ අන්තෝනි මුනිතුමා ය. (4) අසීසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් මුනිතුමා ය.

18. දෙවියන් වහන්සේ සමග 'නිහඬ ආදරය' ගොඩනගා ගත හැක්කේ,
(1) යහපත් මිතුරන් ඇසුරිනි. (2) දස පනත පිළිපැදීමෙනි.
(3) ධ්‍යානයට සම වැදීමෙනි. (4) ආගමික අධ්‍යාපනය ලැබීමෙනි.

19. යාච්ඤාවේ මූලිකාංගයක් වන්නේ,
(1) ශබ්ද නගා උච්චාරණය කිරීමයි. (2) නිවැරදි ඉරියව්වෙන් දෙවිඳුන් යැදීමයි.
(3) සාමයෙන් ජීවත් වීමයි. (4) එකමුතුකම වර්ධනය කිරීමයි.

20. ශුද්ධ වූ තෛල භාවිත කරමින් දානය කරනු ලබන ප්‍රසාද නිධාන ගණන කීය ද?
(1) දෙකකි. (2) තුනකි. (3) හතරකි. (4) හයකි.

21. දෙවිඳුන් දුන් බුද්ධියෙන් සිදු කළ මිනිස් සොයා ගැනීම් වන්නේ,
(1) සූර්යයා හා චන්ද්‍රයා ය. (2) ග්‍රහලෝක ය. (3) තාරකා ය. (4) විද්‍යාව ය.

22. මානව වර්ගයාගේ ආරම්භය ගැන අවධානය යොමු කරන විට කිතු දහම අනුව අපගේ මනස දිව යන්නේ ශුද්ධ බයිබලයේ කිනම් ග්‍රන්ථයකට ද?
(1) ධර්ම දේශකයා (2) වීරාවලිය (3) උත්පත්ති (4) හිතෝපදේශය

WWW.OLEVELAPI.COM

23. දේව සමානකමට අනුව තෝරා ගැනීමට සහ තීරණ ගැනීමට මිනිසා තුළ ඇති හැකියාව දැක්වෙන්නේ කුමක් ලෙසින් ද?
(1) ආධිපත්‍යය (2) ප්‍රඥාව (3) නිදහස් කැමැත්ත (4) අමරණීයත්වය

24. විද්‍යාව හා කතෝලික විශ්වාසය පරස්පර නොවන බවට කදිම උදාහරණයක් වන්නේ,
(1) දූවිල්ලේ අංශු සහ මිනිස් සිරුරේ මූලද්‍රව්‍ය සමාන බව ය.
(2) නොදැවෙන පඳුර තුළින් දෙවියන් වහන්සේ මෝසෙස්ට දර්ශනය වීම ය.
(3) ඊශ්‍රායෙල් සෙනඟ රතු මුහුදෙන් එතෙර වීම ය.
(4) කිතු උපතේ දී වල්ගා තරුවක් අහසේ දිස් වීම ය.

25. දෙවියන් වහන්සේ තම නාමය හෙළිදරව් කළේ,
(1) ආබ්‍රහම්තුමාට ය. (2) ඊසාක්තුමාට ය. (3) ජාකොබ්තුමාට ය. (4) මෝසෙස්තුමාට ය.

26. පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව තම තෝරා ගත් සෙනඟ ලෙස පත් කර ගැනීමේ සිද්ධියේ ප්‍රධානතම දේව අනාවරණය ලෙස දැක්විය හැක්කේ කුමක් ද?
(1) දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව සමග ගිවිසුමක් ඇති කර ගැනීම
(2) දෙවියන් වහන්සේගේ එඩිතර බව පෙන්වීම
(3) දෙවියන් වහන්සේගේ බලමහිමය පෙන්වීම
(4) දෙවියන් වහන්සේ පාරාවෝ සමග ගිවිසුමක් ඇති කර ගැනීම

/තුන්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

27. පුරාණ ගිවිසුම තුළ දේව අනාවරණය ප්‍රබලව ප්‍රකාශ වූ ගිවිසුම කුමක් ද?
    (1) ආදම් සහ ඒව සමඟ ඇති කර ගත් ගිවිසුම
    (2) මෝසෙස් සමඟ ඇති කර ගත් ගිවිසුම
    (3) නෝවා සමඟ ඇති කර ගත් ගිවිසුම
    (4) ආබ්‍රහම් සමඟ ඇති කර ගත් ගිවිසුම

28. ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මදූත කාර්යයේ උච්චතම අවස්ථාව වනුයේ,
    (1) මාංශගතවීමේ අභිරහස ය.
    (2) පාස්කු අභිරහස ය.
    (3) අන්‍ය රූප විලාස වීම ය.
    (4) ක්‍රිස්තුන් වහන්සේගේ බෞතිස්මය ය.

29. පැරණි ආදම්ගේ අකීකරුකම තුළින් නැති වූ දේව දරුකමේ උරුමය නව ආදම්ගේ කීකරුකම තුළින් නැවත ලැබුණි. මෙහි නව ආදම් වනුයේ කවුරුන් ද?
    (1) ශුද්ධ වූ පාවුලුතුමා
    (2) ශුද්ධ වූ පේදුරුතුමා
    (3) මරිය වහන්සේ
    (4) ක්‍රිස්තුන් වහන්සේ

30. ක්‍රිස්තුන් වහන්සේ පව්කාරයිනට දැක්වූ අනුකම්පාව දෙවියන් වහන්සේ පව්කාරයිනට දක්වන අනුකම්පාවට සමාන බව පිළිගැනීම ප්‍රතික්ෂේප කළේ කවුරුන් ද?
    (1) ඊශ්‍රායෙල් ආගමික නායකයින්
    (2) නායිම් නුවර වැන්දඹුව
    (3) අන්‍ය ජාතිකයින්
    (4) ශතාධිපතියාගේ මෙහෙකරුවා

31. ශුද්ධ වූ ජුසේවාස් පියතුමා අයත් පැවිදි නිකාය කුමක් ද?
    (1) ෆ්‍රැන්සිස්කාන (2) ඔරතෝරියාන (3) බෙනදික්තාන (4) දොමිනිකාන

32. යාවජීව ගිවිසුමක් වන ප්‍රසාද නිධානය වන්නේ,
    (1) රෝගීන්ගේ ආලේපය ය.
    (2) සමගි සන්ධානය ය.
    (3) ආශිර්වාදකාර බන්ධනය ය.
    (4) අභිවෘද්ධි ආලේපය ය.

33. ආශිර්වාදකාර බන්ධනය නමැති ප්‍රසාද නිධානය දානය කරන අවස්ථාවේ ක්‍රිස්තුන් වහන්සේගේ දෘශ්‍යමාන නියෝජිතයා වන පූජ්‍ය ප්‍රසාදිතුමා පෙනී සිටින්නේ,
    (1) විවාහ ලේකම් ලෙස ය.
    (2) සභාවේ නිල සාක්ෂිකරුවා ලෙස ය.
    (3) විවාහ මංගල්‍ය ආරාධිතයකු ලෙස ය.
    (4) විවාහ මංගල්‍ය අධ්‍යක්ෂවරයකු ලෙස ය.

34. නික්මයාම පොතට අනුව දරුවනට දීර්ඝායුෂ හා සුවසෙත ලැබීම සඳහා පිළිපැදිය යුතු දේව පනත වන්නේ,
    (1) හතරවැනි පනත ය.
    (2) පස්වැනි පනත ය.
    (3) හයවැනි පනත ය.
    (4) නවවැනි පනත ය.

35. පුරාණ ගිවිසුමේ මුලින් ම සඳහන් කරනු ලබන පූජකයාගේ නම කුමක් ද?
    (1) ආබ්‍රහම් (2) ජාකොබ් (3) මෙල්කිසෙදෙක් (4) මෝසෙස්

36. පහත දැක්වෙන ඒවා සලකා බලන්න.
    A – දේව වාක්‍ය ප්‍රකාශ කිරීම
    B – දුකේ දී හා සැපේ දී එකට සිටීම
    C – එඬේරික සේවය
    D – පූජකවරය හැර අනෙක් ප්‍රසාද නිධාන දානය කිරීම
    ඉහත ඒවා අතුරෙන් පූජකවරය හා සම්බන්ධ වන්නේ,
    (1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය. (4) B, C හා D ය.

37. කීකරුකම, දිළිඳුකම හා ව්‍රත ශුද්ධිය යනු,
    (1) පැවිදි පන්තිවල පොදු ධර්ම ගුණාංග වේ.
    (2) යහපත් සාරධර්ම වේ.
    (3) ශුද්ධාත්ම දීමනා වේ.
    (4) පැවිදි වේද භාර වේ.

WWW.OLEVELAPI.COM

38. ශ්‍රී ලංකාවට පෘතුගීසි යුගයේ සේවය සඳහා පැමිණි ධර්මදූත කණ්ඩායමක් වන්නේ,
    (1) ජපමාල නිකායයි. (2) ෆ්‍රැන්සිස්කාන නිකායයි. (3) නිමල මරිය නිකායයි. (4) බෙනදික්තාන නිකායයි.

39. ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහසට සම්බන්ධ වීමෙන් අප ලබන භාග්‍යවන්ත බව නම්,
    (1) මෙලොවෙහි අප ජීවත් කරවීමයි.
    (2) ජීවිත කරදර අවම වීමයි.
    (3) ජීවිතය පහසුවෙන් ගත කිරීමයි.
    (4) ස්වර්ගීය සැපත කරා අප ගෙන යාමයි.

40. මනුෂ්‍යයා හුදකලා වී අවිනිශ්චිත තත්ත්වයට පත්වීමට හේතුවක් වන්නේ,
    (1) අසල්වැසියා සමඟ අමනාප වීමයි.
    (2) දේව ප්‍රසාද නිධාන ලබා නොගැනීමයි.
    (3) තනිව කල්පනා කිරීමයි.
    (4) දෙවි මිනිස් සංවාදයෙන් ඈත් වීමයි.

* *

[හතරවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....